04 ස්වාභාවික උපද්‍රව සහ ආපදා

ස්වාභාවික උපද්‍රව හා ආපදා පිළිබඳවත් ශ්‍රී ලංකාවේ
ඇති වන ස්වාභාවික ආපදා පිළිබඳවත් අධ්‍යයනය කිරීම
මෙම පරිච්ඡේදයේ අරමුණ වේ.

වර්තමානයේ ලෝකයේ ස්වාභාවික ව ඇති වන විවිධ ආපදා පිළිබඳ ව නිරන්තරයෙන් අසන්නට ලැබේ. මෙබඳු ආපදා නිසා මිනිස් ජීවිත, දේපළ, පොදු පහසුකම් සහ ස්වාභාවික පරිසරයට එල්ල වන තර්ජන බොහෝ ය.

4.1 රූපය - ආපදා අවස්ථා කිහිපයක්

ස්වාභාවික ව හෝ මානුෂ ක්‍රියාකාරකම් හේතුවෙන් ප්‍රජාවට හෝ දේපළවලට හානි සිදු විය හැකි ස්වාභාවික සංසිද්ධි, උපද්‍රව ලෙස හැඳින්වේ. උපද්‍රව නිරන්තරයෙන් සිදු වෙමින් පවතින ක්‍රියාවලියකි. මෙවැනි සිදුවීම්, ප්‍රජාවට හෝ දේපළවලට විනාශකාරී ලෙස බලපාන්නේ නම් එය ආපදාවක් බවට පත් වේ.

4.2 රූපය - උපද්‍රවය

4.3 රූපය - ආපදාව

නායයෑම, කඳුකර ප්‍රදේශවල පවතින උපද්‍රවයකි. එහෙත් එය ආපදාවක් බවට පත්වන්නේ මිනිසාට හා දේපළවලට සිදු වන බලපෑම් අනුව ය. මිනිසුන් නොමැති දූපතක සිදු විය හැකි නායයෑමක් මගින් මිනිසුන්ට හා දේපළවලට හානි නොවන බැවින් එය ස්වාභාවික ව සිදු වන උපද්‍රවයක් පමණි. එසේ වුව ද මිනිසුන් අධික ජනාකීර්ණ ප්‍රදේශයක සිදු වුවහොත් එය ආපදාවක් බවට පත් වේ.

ක්‍රියාකාරකම්

01. ඔබ අසා ඇති ස්වාභාවික උපද්‍රව පහක් නම් කරන්න.
02. ස්වාභාවික ආපදාවකින් සිදු විය හැකි හානි පහක් සඳහන් කරන්න.
03. ස්වාභාවික ආපදා පිළිබඳ පින්තූර ගොනුවක් සකස් කරන්න.

ශ්‍රී ලංකාවේ ඇති වන ස්වාභාවික ආපදා

ස්වාභාවික ආපදාව, කෙටි කාලීන ව ඇති විය හැකි විනාශකාරී බලවේගයකි. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන බොහොමයක් උපද්‍රව, වර්තමානයේ දී අහිතකර මිනිස් ක්‍රියාකාරකම් නිසා ආපදා බවට පත් වීම වැඩි වෙමින් පවතී. එලෙස ආපදා බවට පත් ව ඇති උපද්‍රව ලෙස නියඟ, ගංවතුර, නායයෑම්, සුළි සුළං, අකුණු සැර, සුනාමි, භූමිකම්පා යනාදිය දැක්විය හැකි ය.

නියඟය

යම් ප්‍රදේශයකට නිශ්චිත කාලවකවානුවක් තුළ ලැබිය යුතු සාමාන්‍ය වර්ෂාපතනය නොලැබී යාම නිසා පරිසරයේ ඇති වන වියළි ස්වභාවය නියඟය ලෙස හැඳින්වේ.

නියඟ, ඕනෑ ම ප්‍රදේශයක ඕනෑ ම කාලයක පවත්නා උපද්‍රවයකි. අනෙක් ස්වාභාවික උපද්‍රව තරම් නියඟය කෙරෙහි දක්වන අවධානය අඩු ය. එසේ වන්නේ නියඟය අපට නොදැනෙන අයුරින් ආරම්භ වී ක්‍රමයෙන් වර්ධනය වී

මුළු මහත් ජන සමාජයට ම අර්බුදකාරී තත්ත්වයක් ඇති කිරීමට සමත් නිහඬ ව්‍යසනයක් (ආපදාවක්) වන බැවිනි. ශ්‍රී ලංකාවේ නියඟ බලපාන දිස්ත්‍රික්ක කිහිපයක් 4.1 සිතියමෙහි දක්වා ඇත.

නියඟ ඇති වීමට බලපාන හේතු :

- දීර්ඝ කාලයක් තිස්සේ වර්ෂාපතනය අඩු වීම
- වනාන්තර ගිනි තැබීම
- වියළි සුළං ප්‍රවාහ
- ගෝලීය උණුසුම වැඩි වීම
- ශාක ආවරණය ඉවත් වීම



4.1 සිතියම - ශ්‍රී ලංකාවේ නියඟ බලපාන දිස්ත්‍රික්ක කිහිපයක්

නියඟයෙන් ඇති වන හානි

නියඟයේ අහිතකර බලපෑම් අංශ දෙකක් යටතේ සාකච්ඡා කළ හැකි ය. මිනිසාට ඇති වන බලපෑම් හා පරිසරයට ඇති වන බලපෑම් වශයෙනි.

මිනිසාට ඇති වන බලපෑම්

- ජලය හිඟ වීම
- කෘෂි අස්වනු විනාශ වීම
- ආහාර හිඟය
- වසංගත රෝග පැතිරීම
- සතුන්ට හානි සිදු වීම

පරිසරයට ඇති වන බලපෑම්



- පරිසර උෂ්ණත්වය ඉහළ යාම
- භූගත ජල මට්ටම පහළ බැසීම
- ලැව්ගිනි ඇති වීම
- වනාන්තර විනාශ වීම
- ජෛව සම්පත් විනාශ වීම
- පස නිසරු වීම
- පාරිසරික සුන්දරත්වයට හානි පැමිණීම

ක්‍රියාකාරකම්

01. ශ්‍රී ලංකාවේ නියඟ ඇති වන ප්‍රදේශ ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර සේයා කරන්න.
02. නියං උපද්‍රවය ඇති වීමට බලපාන හේතු දෙකක් ලියන්න.
03. නියං ආපදාව මානුෂ ක්‍රියාකාරකම් සඳහා බලපාන ආකාරය පිළිබඳ ව කරුණු තුනක් ඉදිරිපත් කරන්න.
04. නියඟය ඇති අවස්ථාවක දී පරිසරයේ සිදු වන වෙනස්වීම් නිරීක්ෂණය කර හෝ තොරතුරු සොයා වාර්තාවක් සකස් කරන්න.

ගංවතුර

ඇළදොළ, ගංගා, ජලාශ ආදියට කෙටි කාලීන ව අධික ජලස්කන්ධයක් එකතු වූ විට එය උතුරා පිටාර ගැලීම සිදු වේ. වර්තමානයේ ගංගා, ඇළදොළ නොමැති නාගරික ප්‍රදේශවල පවා සුළු වර්ෂාවක දී වුව ද වැසි ජලය පිටාර ගැලීම සුලබ ව දක්නට ලැබෙන ලක්ෂණයකි. ශ්‍රී ලංකාවේ ගංවතුර ආපදාවට ලක්වන දිස්ත්‍රික්ක කිහිපයක් 4.2 සිතියමෙහි දැක්වේ. එසේ වුව ද වර්ෂාපතන තීව්‍රතාව වැඩි වීමෙන් ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක ම ගංවතුර ආපදාව ඇති විය හැකි ය.



4.2 සිතියම - ශ්‍රී ලංකාවේ ගංවතුර ආපදාවට ලක්වන දිස්ත්‍රික්ක කිහිපයක්

ගංවතුර ඇති වීමට බලපාන හේතු

- නොකඩවා ඇද හැලෙන අධික වර්ෂාව
- කඳු ප්‍රදේශවල වනාන්තර එළි කිරීම
- පහත් බිම් ගොඩ කිරීම
- ගංගා නිම්නවල වැලි ගොඩ දැමීම



4.4 රූපය - ගංවතුරින් සිදු වන හානි

ක්‍රියාකාරකම්

01. i. ශ්‍රී ලංකාවේ ගංවතුර ආපදාව ඇති වන ගංගාධාර පහක් ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.
    ii. ගංවතුර ආපදාවට ලක්වන දිස්ත්‍රික්ක පහක් එම සිතියමෙහි සේයා කර දක්වන්න.
02. ගංවතුර ආපදා බහුල ව ම ඇති වන්නේ කුමන දේශගුණික කලාපයේ ද?
03. ගංවතුර ආපදාව ඇති විය හැකි වියළි කලාපීය දිස්ත්‍රික්ක මොනවා ද?
04. ගංවතුර අවස්ථාවක් චිත්‍රයට නගන්න.

නායයෑම්

> "උස්බිම් ප්‍රදේශයක පවතින ගල්, බොරළු, පස් කුට්ටිවලින් සමන්විත පොළොවේ විශාල කොටසක් බෑවුම දිගේ පහළට රූටා යාම නායයෑමක් ලෙස හැඳින්විය හැකි ය".

නායයෑම වර්තමානයේ ශ්‍රී ලංකාවේ බහුල ව සිදු වන ආපදාවකි. මෙය ස්වාභාවික ව සිදු වන ක්‍රියාවලියක් වුව ද මේ සඳහා ප්‍රධාන වශයෙන් මානුෂ ක්‍රියාකාරකම් බලපා තිබේ. නායයෑමට බලපාන හේතු කොටස් දෙකකට බෙදිය හැකි ය.

ස්වාභාවික හේතු	මානුෂ ක්‍රියාකාරකම්
නොකඩවා පවතින වර්ෂාව	කඳු ප්‍රදේශවල කැළෑ ගිනි තැබීම
භූමිය අධික බෑවුම් සහිත වීම	නිසි සැලසුමකින් තොර ව කඳුකර ප්‍රදේශවල ඉඩම් පරිහරණය කිරීම
දිරාපත් වූ පාෂාණ ස්තර තිබීම	ඉදිකිරීම්වල දී ප්‍රමාණවත් ලෙස ගවේෂණ සිදු නොකිරීම
භූමිකම්පා ඇති වීම	ස්වාභාවික ජල මාර්ග අවහිර කිරීම
	උස් බිම්වල ජලය රඳවා තැබීම

ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් නායයෑම්වලට ලක්වන දිස්ත්‍රික්ක කිහිපයක් 4.3 සිතියමෙහි දැක්වේ.



4.3 සිතියම - ශ්‍රී ලංකාවේ නායයෑම්වලට ලක්වන දිස්ත්‍රික්ක කිහිපයක්

නායයෑම්වලින් සිදු වන හානි

- ජීවිත හා දේපළ විනාශ වීම
- වගා බිම් විනාශ වීම
- පරිසරය විනාශ වීම
- ජලාශ ගොඩ වීම හා ඇළ මාර්ග අවහිර වීම
- යටිතල පහසුකම් විනාශ වීම
- සාමාන්‍ය ජන ජීවිතය අඩාළ වීම

ක්‍රියාකාරකම්

01. නායයෑම යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.
02. නායයෑම් බහුල ව සිදු වන දිස්ත්‍රික්ක පහක් ශ්‍රී ලංකා සිතියමක ලකුණු කොට සේයා කරන්න.
03. පහත සඳහන් කරුණු අතරින් නායයෑම්වලට බලපාන හේතු තෝරා ලියන්න.

    සුළං හැමීම, අධික වර්ෂාව, අධික උෂ්ණත්වය, පහත් බිම් ගොඩ කිරීම, අධික බෑවුම් සහිත වීම, කඳු ප්‍රදේශවල වගා කිරීම, භූමිය සමතලා වීම, උස් බිම්වල ජලය රඳවා තැබීම, ගංගා මුවදොර අවහිර කිරීම, භූමිකම්පා ඇති වීම.
04. නායයෑමක දී සිදු විය හැකි විපත් ඇතුළත් කරමින් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
05. නායයෑම් වළක්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් යෝජනා කරන්න.

සුළි සුළං (සුළි කුණාටු)



4.4 සිතියම - ශ්‍රී ලංකාවේ සුළි සුළං බලපෑමට ලක්වන දිස්ත්‍රික්ක කිහිපයක්

සුළියක් ලෙස ඉතා වේගයෙන් කරකැවෙමින් හමා යන වේගවත් සුළඟ, සුළි සුළං නොහොත් සුළි කුණාටු ලෙස හැඳින්වේ.

නිවර්තන කලාපයේ පවතින අධික උෂ්ණත්වය සහ ඒ හේතුකොට ගෙන වර්ධනය වන අඩු පීඩන කේන්ද්‍ර, සුළි කුණාටු නිර්මාණය වීම කෙරෙහි බලපා ඇත.

ශ්‍රී ලංකාව, නිවර්තන කලාපයේ පිහිටා ඇති රටකි. බෙංගාල බොක්ක ප්‍රදේශයෙහි නිරන්තරයෙන් හටගන්නා අඩු පීඩන කේන්ද්‍රවල බලපෑම නිසා ද්වීපයක් ලෙස පිහිටි ශ්‍රී ලංකාව ද නිතර සුළි කුණාටුවල බලපෑමට හසු වේ.

නැගෙනහිර වෙරළින් ශ්‍රී ලංකාවට ඇතුළු වන මෙම සුළං විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වී වයඹ දිග වෙරළින් පිටවී යයි. එමගින් දිවයිනේ උතුරු නැගෙනහිර ප්‍රදේශවලට වැඩි බලපෑමක් ඇති කෙරේ. 4.4 සිතියම නිරීක්ෂණය කොට සුළි සුළංවල බලපෑමට ලක් වන ප්‍රදේශ හඳුනා ගන්න.

සුළි සුළංවලින් සිදු වන හානි

- අධික වර්ෂාව සහ වේගවත් සුළං නිසා විශාල ලෙස ජීවිත හා දේපළ හානි සිදු වීම.
- වගාවන් විනාශ වීම
- විදුලිය, ප්‍රවාහනය ආදී යටිතල පහසුකම් බිඳ වැටීම.
- වෙරළ ආශ්‍රිත ප්‍රදේශවල මුහුද ගොඩ ගැලීම.

ක්‍රියාකාරකම්

01. සුළි සුළඟක් යනු කුමක් ද?
02. සුළි සුළං බලපැවැත්වෙන දිස්ත්‍රික්ක ශ්‍රී ලංකා සිතියමක ලකුණු කර එම ප්‍රදේශ සේයා කරන්න.
03. සුළි සුළඟකින් සිදු විය හැකි අනතුරු ඇතුළත් කොට ලේඛනයක් සකස් කරන්න.
04. එම අනතුරු අවම කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්න.

අකුණු සැර

වලාකුළක් තුළ ඇති විය හැකි විද්‍යුත් ක්‍රියාකාරිත්වය මත ප්‍රතිවිරුද්ධ ආරෝපණ දෙකක් අතර සිදු වන විදුලිය මුදාහැරීම අකුණු ලෙස හැඳින්වේ.

මෙසේ විදුලිය මුදාහැරීම එක ම වලාකුළක් තුළ හෝ වලාකුළු දෙකක් අතර හෝ වලාකුළක සිට පොළොවට හෝ සිදු විය හැකි ය. එමගින් භූ තලයට විශාල හානියක් සිදු වේ. ශ්‍රී ලංකාවේ බොහෝ දුරට අකුණු ඇති වන්නේ සංවහන ක්‍රියාවලිය සිදු වන මාර්තු, අප්‍රේල් හා ඔක්තෝම්බර්, නොවැම්බර් යන මාසවල දී ය. එසේ වුව ද වසරේ ඕනෑ ම කාලයක අකුණු ඇති විය හැකි ය.

අකුණු සැර වැදිය හැකි අවස්ථා කිහිපයක්

අකුණු සැරවලින් සිදු වන හානි

- මිනිස් ජීවිත හා දේපළ විනාශ වීම.
- විදුලි රැහැන් පද්ධති බිඳ වැටීම.
- නිවාස විනාශ වීම.
- සන්නිවේදන ජාල අක්‍රීය වීම හා විනාශ වීම.

අකුණු අනතුරු වළක්වා ගැනීම

- ගිගුරුම් සහිත වර්ෂා අවස්ථාවල එළිමහන් ස්ථානවල රැඳී නොසිටීම.
- උසින් වැඩි ගස් යට නොසිටීම.
- එවැනි අවස්ථාවල ගමන් බිමන්වලින් වැළකී සිටීම.
- නිවස තුළ විදුලි රැහැන් පද්ධති ක්‍රියාවිරහිත කිරීම.
- දුරකථන භාවිත නොකිරීම.
- අධිබල විදුලි රැහැන් යට ගොඩනැගිලි ඉදිනොකිරීම.
- නිවාස ඉදිකිරීමේ දී ආරක්ෂාකාරී ලෙස විදුලි පරිපථ සවි කර ගැනීම සඳහා පුහුණු කාර්මිකයකු යොදවා ගැනීම.

ක්‍රියාකාරකම

අකුණුවලින් සිදු වන අනතුරු වළක්වා ගැනීම හෝ අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග ඇතුළත් කොට මහජනතාව දැනුවත් කිරීම සඳහා උපදෙස් පත්‍රිකාවක් සකස් කරන්න.

සුනාමි

මුහුදු පත්ලේ සිදු වන භූමිකම්පාවක්, නායයෑමක් හෝ ගිනිකඳු පිපිරීමක් හේතුකොට ගෙන වෙරළ කරා එන වේගවත් රළ "සුනාමි" ලෙස හැඳින්වේ.

"සුනාමි" යනු ජපන් භාෂාවෙන් බිඳී ආ වචනයකි. 'Tsu' (සු) යන්නෙන් "වරාය" යන්න ද, 'nami' (නාමි) යනු "රළ" යන්න ද අදහස් වේ. සුනාමි යනු වෙරළ කරා එන ඉතා උස් වූ මුහුදු රළ ලෙස ද හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකාව දූපතක් වන බැවින් දිවයින වටා ඇති වෙරළ ආශ්‍රිත සියලු ම ප්‍රදේශවලට සුනාමි උපද්‍රවය පවතී. මෙය අනෙකුත් ආපදා මෙන් සුලභ නොවූව ද ඉන් ඇති වන බලපෑම අතිවිශාල වේ. 2004 දෙසැම්බර් 26 දින ශ්‍රී ලංකාවට බලපෑ ඉතා බිහිසුණු සුනාමි ආපදාව නිසා ජීවිත හා දේපළවලට විශාල හානියක් සිදු විය.

සුනාමි ඇති වීමට බලපාන හේතු

- මුහුදේ සිදු වන, භූමිකම්පා
- නායයෑම්
- ගිනිකඳු පිපිරීම් සහ සාගරයට උල්කාපාත වැටීම

සුනාමියකින් සිදු වන බලපෑම්

- ජීවිත හානි
- නිවාස, ගොඩනැගිලි, යාන වාහන, ව්‍යාපාරික ස්ථාන විනාශ වීම.
- වෙරළබඩ කලපු, මෝය, කඩොලාන, වගුරු, මුහුදු තෘණ විනාශ වීම.
- ජනතාවට මානසික අසහනය ඇති වීම.
- මිනිසුන් අවතැන් වීම.
- ජලය, ගොඩබිම දූෂණය
- ශාක, සතුන් විනාශ වීම.
- වෙරළ ආශ්‍රිත ධීවර, කොහු, සංචාරක කර්මාන්ත බිඳ වැටීම.
- ජලය, විදුලිය, මහාමාර්ග වැනි යටිතල පහසුකම් විනාශ වීම.

සුනාමියකින් වැළකීම සඳහා,

- සුනාමි අනතුරු ඇඟවීම් පිළිබඳ ව විමසිල්ලෙන් සිටීම.
- සුනාමි අවස්ථාවක දී වෙරළ ආසන්නයෙහි රැඳී නොසිටීම.
- හැකි ඉක්මණින් උසින් වැඩි ආරක්ෂිත ස්ථාන කරා යෑම.

ක්‍රියාකාරකම්

01. "සුනාමි" යන්න කෙටියෙන් හඳුන්වන්න.
02. සුනාමි ඇති වීම කෙරෙහි බලපානු ලබන හේතු තුනක් ලියන්න.
03. ශ්‍රී ලංකාවට සුනාමි ආපදාවක් ඇති වූයේ කවර දිනයක දී ද?
04. ශ්‍රී ලංකාවේ සුනාමි ආපදාවට ලක් වූ ප්‍රදේශ, ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.

භූමිකම්පා

පෘථිවි අභ්‍යන්තරයේ ඇති අධික උෂ්ණත්වය හා පීඩන වෙනස්කම් හේතු කොට ගෙන ක්ෂණික ව සිදු වන භූමියේ සෙලවීම භූමිකම්පා ලෙස හැඳින්වේ.

ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක ම භූමිකම්පා උපද්‍රව තත්ත්වයක් පැවතුණ ද මෙතෙක් එය ආපදා තත්ත්වයක් බවට පත්වී නොමැත. එසේ වුව ද ආසන්න ප්‍රදේශවල සිදු වන භූමිකම්පා මගින් ශ්‍රී ලංකාවට ද ආපදා ඇති විය හැකි ය.

භූමිකම්පා ඇති වීමට බලපාන හේතු

- පෘථිවි අභ්‍යන්තරයේ ඇති අධික උෂ්ණත්වය හා පීඩන වෙනස්කම්
- විශාල ජලාශ සහ වෙනත් මහා පරිමාණ ඉදිකිරීම් නිසා පෘථිවි සමතුලිතතාව බිඳ වැටීම
- න්‍යෂ්ටික පිපිරවීම්
- ගිනිකඳු පිපිරීම්

භූමිකම්පා මගින් ඇති වන හානි

- ජීවිත, දේපළ විනාශ වීම
- මිනිසුන් අවතැන් වීම
- එදිනෙදා කටයුතු අඩාල වීම
- වගා බිම් විනාශ වීම
- ශාක හා සතුන් විනාශයට පත් වීම

ක්‍රියාකාරකම

භූමිකම්පා මගින් ඇති විය හැකි හානි ඇතුළත් කර පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

මිනිසුන්ට වන හානි	පරිසරයට වන හානි

ආපදා අවස්ථාවකට මුහුණ දීම

ස්වාභාවික ආපදා මුළුමනින් ම වළක්වාලීමට මිනිසාට හැකියාවක් නොමැත. එහෙත් එමගින් ඇති වන හානිය අවම කර ගත හැකි ය. ඒ සඳහා ආපදා කළමනාකරණය වැදගත් වේ. පෙර සූදානම, ආපදා අවස්ථාවේ දී ක්‍රියාත්මක වීම සහ ආපදාවෙන් පසු ක්‍රියාත්මක වන ආකාරය ආපදා කළමනාකරණයෙහි මූලිකාංග වේ.

ආපදා කළමනාකරණ චක්‍රය අනුව ආපදා අවස්ථාවල දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ නිදසුන් කිහිපයක් පහත දැක්වේ.



පෙර සූදානම

- අවදානම් කලාප හඳුනා ගැනීම හා එම ස්ථානවලින් ජනතාව ඉවත් කිරීම
- ආපදා, ආපදා සිදු වන ස්ථාන හා සිදු විය හැකි කාල සීමාවන් පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම
- වන වැස්ම ආරක්ෂා කිරීම
- ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම
- ගොඩනැගිලිවල අකුණු සන්නායක සවි කිරීම
- අධිබලැති විදුලි රැහැන් යට ගොඩනැගිලි ඉදිනොකිරීම
- ආපදාවලට ඔරොත්තු දෙන ලෙස නිවාස ඉදිකිරීම
- ආසන්න කලාපවල භූමිකම්පාවක් සිදු වී තිබේ නම් සුනාමි ආපදා පිළිබඳ විමසිලිමත් ව සිටීම

ආපදා අවස්ථාව

- අනතුරට ලක්වූවන් ආරක්ෂිත ස්ථාන වලට ගෙන යාම
- දේපළ නොව ජීවිත රැක ගැනීමට උත්සාහ දැරීම
- ආපදාවට ශක්තිමත් ලෙස මුහුණ දීම
- අනතුරට ලක්වූවන් සඳහා වෛද්‍ය ආධාර හා ප්‍රතිකාර ලබා දීම
- අනාථ වූවන් සඳහා ආහාරපාන ලබා දීම
- අනතුරු සිදු විය හැකි ගොඩනැගිලිවලින් ඉවත් කිරීම
- අපිරිසිදු ආහාර ගැනීමෙන් වැළකීම

ආපදාවෙන් පසු

- ගැටලු හඳුනා ගැනීම
- හදිසි ආපදා මධ්‍යස්ථාන පිහිටුවීම
- ආපදා කට්ටල හඳුන්වා දීම
- ආපදාවට පත්වූවන්ට සහන සැලසීම
- සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආපදාවට ගොදුරු වූවන්ගේ මානසික සෞඛ්‍ය ගොඩනැංවීම සඳහා අදාළ කටයුතු සැලසුම් කිරීම

ක්‍රියාකාරකම්

01. ස්වාභාවික උපද්‍රව පහක් නම් කරන්න.
02. ස්වාභාවික උපද්‍රව හා ආපදා අතර ඇති වෙනස පැහැදිලි කරන්න.
03. ස්වාභාවික ආපදා ඇති වීම කෙරෙහි බලපාන මානුෂ ක්‍රියාකාරකම් මොනවා ද?
04. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

ස්වාභාවික ආපදාව	ඇති වීමට හේතු	ආපදා අවම කර ගැනීමේ ක්‍රම
ගංවතුර	01. 02.	
නියඟ	01. 02.	
සුළි සුළං	01. 02.	
නායයෑම්	01. 02.	

පැවරුම්

01. ශ්‍රී ලංකාවේ නිරන්තරයෙන් සිදු වන ස්වාභාවික ආපදා දෙකක් නම් කරන්න.
02. පුවත්පත්, සඟරා යනාදිය ආධාර කර ගනිමින් ශ්‍රී ලංකාවේ ස්වාභාවික ආපදාවලට ලක් වූ ප්‍රදේශවල පින්තූර ඇතුළත් තොරතුරු ගොණුවක් සකස් කරන්න.
03. එම ප්‍රදේශවල ආපදා ඇති වීමට බලපා ඇති හේතු සොයා ඉදිරිපත් කරන්න.
04. සිසුන් කණ්ඩායම් වශයෙන් සංවිධානය වී ආපදා අවස්ථාවකට ගොදුරු වී ඇති ජනතාවට සහාය වීම සඳහා ගත යුතු පියවර ඇතුළත් කරමින් පත්‍රිකාවක් සකස් කරන්න.

ගෝලීය දේශගුණික වෙනස්වීම්

සාමාන්‍ය දේශගුණික රටාවේ දිගු කාලීන හා කෙටි කාලීන ව ඇති වන වෙනස්වීම් දේශගුණික වෙනස්වීම් ලෙස හැඳින්විය හැකි ය.

අතීතයේ දේශගුණික වෙනස්වීම් සිදු වීමට දිගු කාලයක් ගත වුව ද වර්තමානයේ මෙම සිදුවීම් කෙටි කාලයක් තුළ දී සිදු වන බව පෙනේ. මෑත කාලයේ දී නිරතුරු ව ම ඇති වන නියං තත්ත්වයන්, කටුක ශීත සෘතු, ජලගැලීම්, සුළි කුණාටු යනාදිය මෙම දේශගුණික වෙනස්වීම්වල ප්‍රතිඵල ලෙස හඳුනා ගත හැකි ය. ගෝලීය වශයෙන් ඇති වන මෙවැනි දේශගුණික වෙනස්වීම් ශ්‍රී ලංකාවට ද බලපා ඇත.

දේශගුණික වෙනස්වීම් ඇති වීමට හේතු

- අධික ඉන්ධන දහනය
- වනාන්තර විනාශ කිරීම
- වායුගෝලය උණුසුම් වීම
- කෘෂි හා කාර්මික අපද්‍රව්‍ය ගිනි තැබීම
- ගිනිකඳු පිපිරීම

දේශගුණික වෙනස්වීම් ශ්‍රී ලංකාවට බලපාන ආකාරය

1. මුහුදු ජල මට්ටම ඉහළ යාම නිසා වෙරළබඩ පරිසර පද්ධති විනාශ වීම

- වෙරළබඩ බිම් ජලයෙන් යට වීම
- පානීය ජලය දූෂණය වීම
- වෙරළ ඛාදනය වැඩි වීම
- ධීවර කර්මාන්තය අඩාල වීම හා වෙරළබඩ කර්මාන්ත විනාශ වීම

2. අධික වැසි මගින් ඇති වන ආපදා

- ජලගැලීම් හා නායයෑම් වැනි තත්ත්වයන් ඇති වීම
- ජීවිත හා දේපළ හානි සිදු වීම
- යටිතල පහසුකම් විනාශ වීම
- කෘෂි ඵලදාව අඩු වීම

3. **වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා ඇති වන ආපදා**

- නියං තත්ත්වයක් ඇති වීම
- ජල හිඟය
- අස්වැන්න අඩු වීම
- කෘෂිකාර්මික රටාව හා භෝග වර්ග වෙනස් වීම
- බෝවන රෝග වැඩි වීම, හඳුනා ගත නොහැකි රෝග තත්ත්වයන් ඇති වීම
- සමේ රෝග, ශ්වසන රෝග සහ අක්ෂි රෝග බහුල වීම
- මානසික ආතතිය ඇති වීම

4. **බලශක්ති සම්පත් නිෂ්පාදනය හා භාවිතය සම්බන්ධ ගැටලු මතු වීම**

- උෂ්ණත්වය වැඩි වීම නිසා වායු සමීකරණ, විදුලිපංකා වැඩියෙන් භාවිත කිරීමට සිදු වීම
- ජලවිදුලිබල උත්පාදනය අඩාල වීම
- විදුලිබලය හා තාප බලශක්තිය සඳහා ඉල්ලුම වැඩි වීම

දේශගුණික වෙනස්වීම් අවම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග

- කාර්මික, කෘෂිකාර්මික, ප්‍රවාහනය වැනි ක්ෂේත්‍රවලින් වායුගෝලයට මුදාහරිනු ලබන කාබන්ඩයොක්සයිඩ් වැනි අහිතකර වායු ප්‍රමාණය අවම කිරීම.
- වනහරණය අවම කිරීම හා වනාවරණය වැඩි කිරීම
- රක්ෂිත වනාන්තර කලාප ඇති කිරීම
- පරිසරයට බලපෑම් අඩු ජීව වායු භාවිතය ප්‍රබල කිරීම
- ගෝලීය උණුසුම වැඩි කරන වායු (හරිතාගාර වායු) මුදාහැරීම පිළිබඳ සීමා පැනවීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- අනවසර ඉදිකිරීම් තහනම් කිරීම
- ජනතාව දැනුවත් කිරීම
- ලෝකයේ අනෙකුත් රටවල් සමග සාමූහික ව කටයුතු කිරීම

ක්‍රියාකාරකම්

01. ගෝලීය දේශගුණය වෙනස් වීමට බලපාන හේතු මොනවා ද?
02. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා ඇති වන පාරිසරික හානි තුනක් සඳහන් කරන්න.

පැවරුම්

01. දේශගුණික වෙනස්වීම් අවම කිරීමට ඔබට දායක විය හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.
02. ආපදාවකට ලක් වී සිටින ජනතාවගේ දැනුවත් වීම සඳහා ආරක්ෂාකාරී පියවර ඇතුළත් කරමින් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
03. ජනමාධ්‍ය ප්‍රවෘත්ති ආධාරයෙන් ශ්‍රී ලංකාවේ අකුණු මගින් සිදු වන අනතුරු වැඩි වීමට හේතු සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන්න.
04. මෙවැනි ආපදා අවස්ථාවකට ඔබට මුහුණ දීමට සිදු වුවහොත් ඉන් මිදීමට ඔබ ගන්නා පියවර තුනක් යෝජනා කරන්න.
05. i. ඔබ ජීවත් වන හෝ ඔබගේ පාසල අවට ප්‍රදේශයේ හෝ ස්වාභාවික ආපදාවක් සිදු වී තිබේ නම් වැඩිහිටියකු සමග එම ප්‍රදේශයට ගොස් ඒ පිළිබඳ ව නිරීක්ෂණය කරන්න.
    ii. එම ආපදාව නිසා සිදු වී ඇති හානි වාර්තා කර ගන්න.
    iii. එම ආපදාව සිදු වීමට බලපා ඇති හේතු විමසා දැනගන්න.
    iv. සියලු තොරතුරු ඇතුළත් වාර්තාවක් පන්තියට ඉදිරිපත් කරන්න.
    v. එම හානි වළක්වා ගැනීමට හා අවම කිරීමට ගත හැකි පියවර සාකච්ඡා කර ඉදිරිපත් කරන්න.

පාරිභාෂික වචන		
ස්වාභාවික උපද්‍රව	Natural Hazards	இயற்கை அனர்த்தங்கள்
ආපදා	Disasters	பேரனர்த்தங்கள்
නියඟය	Drought	வரட்சி
සුළං	Wind	காற்று
ගෝලීය උණුසුම් වීම	Global Warming	பூகோளம் வெப்பமடைதல்
ළැව්ගිනි	Bush Fires	காட்டுத் தீ
ගංවතුර	Flood	வெள்ளப்பெருக்கு
නායයෑම්	Earth Slip/Land Slides	நிலச்சரிவுகள்
පාෂාණ	Rocks	பாறைகள்
සුළි සුළං	Cyclones	சூறாவளிகள்
අකුණු සැර	Thunderbolt/Lightening	மின்னல் தாக்கம்
විද්‍යුත් ක්‍රියාකාරිත්වය	Electric phenomenon	இலத்திரனியல் தோற்றப்பாடு
සංවහන ක්‍රියාවලිය	Convectional Process	மேற்காவுகைச் செயன்முறை
භූමිකම්පාව	Earth Quake	புவி நடுக்கம்
ගිනිකඳු පිපිරීම	Volcanic Eruption	எரிமலை வெடிப்பு
පෘථිවි සමතුලිතතාව	Equilibrium of the earth	புவியின் சமநிலை
න්‍යෂ්ටික පිපිරවීම්	Nuclear Explosions	அணு வெடிப்புக்கள்
ආපදා කළමනාකරණය	Disaster Management	அனர்த்த முகாமைத்துவம்
ජල පෝෂක ප්‍රදේශ	Catchment Area	நீரேந்து பிரதேசம்
අකුණු සන්නායක	Lightening Conductors	மின்னல் தாங்கிகள்
අවදානම් කලාප	Hazardous Zones	அபாயம்மிக்க வலயங்கள்
හදිසි ආපදා මධ්‍යස්ථාන	Emergency Disaster Centers	அவசர பேரனர்த்த நிலையங்கள்
ආපදා කට්ටල	Disaster Kits	பேரனர்த்தம் தொடர்பான கருவித் தொகுதிகள்
ගෝලීය දේශගුණික වෙනස්වීම	Global Climatic Changes	பூகோளக் காலநிலை மாற்றங்கள்
ඉන්ධන දහනය	Burning of Fuel	எரிபொருள் எரிவு
වෙරළ ඛාදනය	Sea Erosion	கடல் அரிப்பு
වන හරණය	Deforestation	காடழிப்பு